**ශීර්ෂය 281 - ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව**

**-----------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 281 - ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූලි 02 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1. 3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී

සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශ | මෙම වාර්තාවේ ඡේදයට යොමුව |
|---|---|---|
| 1.6.1. (ආ)(iv) | දෙපාර්තමේන්තුව සතු සියලුම වත්කම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. | 1.6.3. (ඇ) |
| 1.6.1.(ආ)(ii) | දෙපාර්තමේන්තුවේ අපහරණයට යෝජිත සියලුම වත්කම් නියමිත වර්ෂවලදී අපහරණය කළ යුතුය. | 1.6.3. (අ) |

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ආදායම් නොවන ලැබීම්**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංචාරක බංගලා කුලී, යන්ත්‍ර කුලි සහ යන්ත්‍ර අපහරණය කිරීමේ ආදායම් ලෙස එකතුව රු. 8,579,831 ක් ගොවිජන කාරක සභා වෙත පැවරීම හේතුවෙන් රජයේ ආදායම ලෙස හඳුනා ගෙන ගිණුම්ගත කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව සතු සංචාරක නිවාස නඩත්තු හා අළුත්වැඩියා කටයුතු සඳහා ඒකාබද්ධ අරමුදලේ ප්‍රතිපාදන වෙන් වීමක් සිදු නොවන බැවින් එම සංචාරක නිවාස විධිමත් පරිදි නඩත්තු කර පවත්වා ගැනීමේ අවශ්‍යතාව සඳහා එම සංචාරක නිවාස අදාල ගොවිජන සේවා මධ්‍යස්ථාන කාරක සභා වෙත පැවරීමක් සිදු කර ඇති අතර, එම කාරක සභා අරමුදල මඟින් සියළු නඩත්තු කටයුතු හා අළුත්වැඩියා කටයුතු සිදු කරනු ලැබේ. එබැවින් අදාල නඩත්තු වියදම් ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා එම සංචාරක නිවාස ආදායම් කම්ටු අරමුදලට බැර කිරීමට කටයුතු කෙරේ. | රජය සතු වත්කම් කුලී ආදායම් එම ආදායම් ශිර්ෂ වලට බැර කල යුතුය. |
| (ii) | මහනුවර ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලයේ පිහිටි පැළ හා කෘෂි උපකරණ අලෙවිසැළ හා ආපනශාලාව බදු දීමෙන් ලද රු.1,394,000 ක මුදල එම කාර්යාලයේ සේවක සුභ සාධක සංගමයට ලබාදීම හේතුවෙන් රජයේ ආදායම ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | අදහස් දක්වා නැත. | රජය සතු වත්කම් කුලී ආදායම් එම ආදායම් ශිර්ෂ වලට බැර කල යුතුය. |
| (iii) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් 2020 වර්ෂයේ සෞභාග්‍යා ගෙවතු 2,000,000 ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ගොවීන් වෙත ලබාදුන් බීජ කට්ටල් අලෙවි කිරීමෙන් ලද රු. 5,483,974 ක ආදායමින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු. 2,600,000 ක මුදල ගෙවීමෙන් පසු ඉතිරි වූ රු. 2,883,974 ක මුදල ගොවිජන සංවර්ධන අරමුදලට බැරකිරීම හේතුවෙන් රජයේ ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | රු.2,883,974 ට අදාලව ඉදිරි කටයුතු සිදුකිරීම සම්බන්ධයෙන් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගෙන් විමසා ඇත. ඒ අනුව ඉදිරි කටයුතු සිදුකරන තෙක් අදාල මුදල ගොවිජන සංවර්ධන අරමුදලට බැරකර ඇත. | බීජ කට්ටල් අලෙවි ආදායම රජයේ ආදායමට බැර කල යුතුය. |

### 1.6.2 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| දෙපාර්තමේන්තු පාලන ගිණුමේ ශේෂය රු.300,238,146 ක් වුවද කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ ශේෂය රු.297,798,523 ක් විය. ඒ අනුව එම ශේෂ අතර රු. 2,439,623 ක වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම වෙනස දීර්ඝ කාලයක සිට පැවත එන හඳුනා ගත නොහැකි හර ශේෂයන් වන අතර, 2023 වර්ෂයේදී හඳුනාගත් ශේෂයන් කිහිපයක් සඳහා ආයතනවලට ලිපි යොමුකර නිරවුල් කිරීමට කටයුතු කර ඇත. මෙම ශේෂය සොයාගැනීමට හැකි සියළුම මාර්ග වලින් තොරතුරු සොයාගැනීමට කටයුතු කරන අතර, 2024 වර්ෂයේ ද මේ පිළිබඳව කෘෂිකර්ම අමාත්‍යාංශය සහ මුදල් අමාත්‍යාංශය මඟින් ලබාදෙන උපදෙස් ප්‍රකාරව නිරවුල් කර ගැනීමට සැලසුම් කර ඇත. | වෙනස නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |

### 1.6.3 දේපළ පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ වර්ෂ අවසාන ශේෂය 2023 වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස ඉදිරියට ගෙන ඒමේදී රු. 8,251,572,806 ක් වැඩියෙන් ගිණුම් වල දක්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු Table SA 80 ආකෘතියට අනුව 2023 දෙසැම්බර් මස මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ 2022 අවසාන ශේෂය 2023 ආරම්භක ශේෂය ලෙස නිවැරදිව නිරූපණය කර ඇත. නමුත් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් උඩුගත කරන ලද වත්කම් සඳහා වන SA 82 ආකෘතියට අනුව ආරම්භක ශේෂයන්හි වෙනසක් පවතින අතර එම වෙනස නිශ්චිතව හඳුනාගෙන නිවැරදි කිරීම සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. | ශේෂයන් නිවැරදිව ඉදිරියට ගෙන ආ යුතුය. |
| (ආ) | පොළොන්නරුව, මොනරාගල, යාපනය, මුලතිව් හා කිලිනොච්චිය දිස්ත්‍රික්ක වල ඇති ගොවිජන සේවා මධ්‍යස්ථාන සතු ඉඩම් හා ගොඩනැඟිලි තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි. | මෙතෙක් තක්සේරු කර ගිණුම්ගත කර නොමැති ගොවිජන සේවා මධ්‍යස්ථානවල ඉඩම් හා ගොඩනැඟිලිවලට අදාල තොරතුරු තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර තක්සේරු කරවා ගැනීමට දිස්ත්‍රික් කාර්යාල දැනුවත් කර ඇත. | ගොවිජන සේවා මධ්‍යස්ථාන සතු ඉඩම් හා ගොඩනැඟිලි කඩිනමින් තක්සේරු කර ගිණුම් ගත කර යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලයේ රු. 4,011,941 ක් වටිනා කාර්යාල උපකරණ, පරිගණක උපකරණ, විදුලි උපකරණ සහ ඉදිකිරීම් උපකරණ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ වාර්තාවට ඇතුලත් කර නොතිබුණි. | හම්බන්තොට දිස්ත්‍රික්කයට අදාළ වත්කම් පමණක් මැයි මස ගිණුම් සාරාංශය මගින් ගිණුම්ගත කරනු ලැබේ. | සියලුම වත්කම් ගිණුම් ගත කළ යුතුය. |
| (ඇ) | 2023 අගෝස්තු 24 දින නිකුත් කළ වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 06/2013 මගින් රාජ්‍ය අංශයේ ආයතනවල වාහන සඳහා මොඩියුලය සකස් කර 2023 දෙසැම්බර් 31 දිනට පෙර කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2023 අගෝස්තු 24 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ 06/2023 දක්වා ඇති විධිවිධාන පරිදි මාර්ගගත මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතිය (NFAMS) යටතේ වාහන මොඩියුලය සඳහා අප දෙපාර්තමේන්තුවට අදාළ තොරතුරු වාර්තා කර ඇත. | වාහන සහ යන්ත්‍ර මොඩියුලය සකස් කර සියලු දත්ත ඇතුලත් කල යුතුයි. |

### 1.6.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාහන අනතුරුවලට අදාළ වාහන අනතුරු සිදුවූ දින සිට හුවමාරු වූ සියලුම ලිපි ඇතුලත් ලිපිගොනුවක් නඩත්තු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය සිදු වූ වාහන අනතුරු 02ක් සම්බන්ධයෙන් එවැනි ලිපි ගොණුවක් නඩත්තු කර නොතිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | වාහන අනතුරු සම්බන්ධයෙන් සියලුම ලිපි ඇතුලත් ලිපිගොනුවක් නඩත්තු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| | | |
|---|---|---|
| වැඩසටහන් 2 යටතේ ගොඩනැගිලි සහ නඩත්තු වියදම් වැය විෂයට සලසා තිබූ රු.2,000,000 ප්‍රතිපාදනයෙන් සියයට 31 ක් ඉතිරිව පැවති අතර ඒ තුල වූ අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලයට ලබා දුන් රු.320,000 ක ප්‍රතිපාදන සියයට 99 ක්ම ඉතිරි වී තිබුණි. | පුනරාවර්තන වියදම් යටතේ ගොඩනැගිලි අලුත්වැඩියා සඳහා ප්‍රතිපාදන නිදහස් කළද, අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලය සම්පූර්ණ අලුත්වැඩියාවක් කිරීමේ බලාපොරොත්තුවෙන් මූලධන වියදමක් ලෙස අලුත්වැඩියා කිරීම වඩාත් සුදුසු යයි යෝජනා කිරීමෙන් එම කාර්යය මූලධන කටයුතු යටතේ සිදුකර ගැනීමට ඉල්ලීම් කළ බැවින් පුනරාවර්තන වියදමක් යටතේ වියදම් සිදුකර නොමැත. | ප්‍රතිපාදන උපරිම ලෙස ප්‍රයෝජනයට ගත යුතුය. |

## 2.2 බැදීම් හා බැරකම්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 නොවැම්බර් 01 දිනැති අංක 05/2023 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී භාවිතා කළ යුතු ආකෘතිවල දක්වා ඇති ඇමුණුම (III) ප්‍රකාරව සහ 2023 නොවැම්බර් 01 දිනැති අංක 04/2023 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයේ 4.5 වගන්තියේ සඳහන් ලෙස නව සිගාස් වෙබ් පිටුවෙන් උඩුගත කරන ලද බැදීම් හා බැරකම් ඇතුළත් කළ යුතු ලෙස දක්වා තිබුණද එයට පටහැනි ලෙස රු. 5,412,273 ක් වූ බැදීම් හා බැරකම් ඇතිකර ගෙන තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | චක්‍රලේඛ අනුව නව සිගාස් වෙබ් පිටුවෙන් උඩුගත කරන ලද බැදීම් හා බැරකම් ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව වෙනත් ආකාරයකට විධිවිධාන සලසා ඇති අවස්ථාවලදී හැර වාර්ෂික ඇස්තමේන්තු මුදල් චක්‍රලේඛයේ වැඩක් හෝ සේවයක් හෝ සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැදීමක් ඇතිකර නොගත යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් 04 ක ප්‍රතිපාදන ඉක්මවා රු. 3,623,094 ක බැරකම්වලට එළැඹී තිබුණි. | CIGAS පද්ධතිය තුල සිදුවූ තාක්ෂණික දෝෂයක් හේතුවෙන් 1403 හා 1302 වැය විෂයන්හි ප්‍රතිපාදන ඉතිරිය සත්‍ය ප්‍රමාණය ඉක්මවා ගොස් තිබුණි. 1402 වැය විෂයය 2023 ඔක්තෝම්බර්, නොවැම්බර් හා දෙසැම්බර් මාසවලට අදාළ විංගල් බිල්පත් ගෙවීමට ප්‍රතිපාදන ඉක්මවා එළඹී ඇති බැරකම් වටිනාකම රු.1,507,979 ක්ද 1409 වැය විෂයය 2023 දෙසැම්බර් මාසයේ පවිත්‍රතා ගෙවීම්වලට අදාළ බැරකම් වටිනාකම රු. 916,958 ක් විය. 1301 වැය විෂයය මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ 3/2022, 8/2022 හා 9/2022 2023.05.22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අනුව කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ (යොමු අංක 4/6/1/Budg.Estimate/2023) 2023.05.31 දිනැති ලිපිය අනුව, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලැබී අවසාන භාගයේ බොහෝ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී. වසර අවසානයේ ඉහත දක්වා ඇති වියදම් සඳහා බැදීම් ඇතිකර ගන්නා ලදී. | ප්‍රතිපාදන ඉක්මවා වියදම් හෝ බැදීම් වලට ඇතුළත් නොවිය යුතුය. |

2.3 වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | **කෘෂිකර්ම අමාත්‍යාංශයේ දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය** | | |
| (i) | සමාලෝචිත වර්ෂයේදී කෘෂිකර්ම අමාත්‍යාංශයේ දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය යටතේ පොළොන්නරුව ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය විසින් රු. 45,750,089 ක් වැය කර වැව් 09 ක් ප්‍රතිසංස්කරණය කර 2024 මාර්තු 28 දින වන විට වැව් 05 ක වැඩ අවසන් කර තිබුණද එම වැව් වල පස් සහ බොරළු යොදා සකස් කල වැව් බැමි සේදී ගොස් තිබුණ ද ඒවා ප්‍රතිසංස්කරණය කර නොතිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | වගකීම් කාලය ඉක්මවීමට ප්‍රථම අදාල ප්‍රතිසංස්කරණයන් සිදු කර ගත යුතුයි. |
| (ii) | කෘෂිකර්ම අමාත්‍යාංශයේ දේශගුණික සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘති යටතේ ලද ප්‍රතිපාදනවලින් රු.37,470,011 ක ඇස්තමේන්තුවකට පොළොන්නරුව ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලයේ ගලින්ද කුඩා වැව ප්‍රතිසංස්කරණය 2023 ජූලි 28 දින ආරම්භ කර 2024 මාර්තු 28 දින අවසන් කිරීමට යෝජිත වුවද එම ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කර නොතිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | නොපමාව අදාල කාර්යය ඉටු කරවා ගත යුතුය. |
| (iii) | පොළොන්නරුව ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලයේ දෙහි අත්තාවල වැවේ සොරොව්ව හරහා ජලය ගෙන යන පස් ඇළ ඉදිකර අවසන් කර තිබුණද වර්ෂාවට ඇළේ බැම්ම විශාල ලෙස සේදී ගොස් ජල හැරවුම් නිර්මිතය (Farm Turnout Structure) ගැලවී ගොස් තිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | වගකීම් කාලය තුල අදාල ප්‍රතිසංස්කරණය කළ යුතුයි. |
| (ආ) | 2022 වර්ෂයේ පරිසර අමාත්‍යාංශය රු.51,565,000 ක ප්‍රතිපාදන යටතේ රු.45,000,000 ක් වැය කර තුම්බිකුලම වැව 2023 අගෝස්තු මස ප්‍රතිසංස්කරණය කර නව කුඹුරු අක්කර 400 කට වැඩි ප්‍රමාණයක් වී වගා කිරීමට සැලසුම් කර ඇතත් එම | පිළිතුරු ලැබී නොමැත. | පූර්ව අනුමැතිය මත ඉදිකිරීමට කටයුතු කළ යුතු අතර අවශ්‍ය අළුත්වැඩියාවන් නිම කර වගාවන් ආරම්භ කිරීමට කටයුතු සැලැස්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පිහිටි කලාපය පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් 2013 වර්ෂයේදී රක්ෂිත වනාන්තරයක් බවට ප්‍රකාශ කර තිබුණි. ඒ සඳහා වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව, පුරා විද්‍යා දෙපාර්තමේන්තුව සහ වන ජීවී දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියක් නොමැතිව, වැව් බැම්ම සංවර්ධනය සඳහා රු.24,373,998 ක වියදමක් දරා තිබුණද 2023 ඔක්තොම්බර් 31 දින වන විට වැව් බැම්මේ වම්පස වානේ සිට මීටර් 50-500 වැව් බැම්ම ඇතුලත හා ඉදිරිපස කොටසේ මීටර් 1000 ක් පමණ කොටසක් දක්වා විශාල ලෙස ඉරිතලා ඛාදනය වී වැව් බැම්මේ මධ්‍යම කොටසද වැව අභ්‍යන්තරයට මීටර් 50 කොටසක් වැව් බැම්ම දෙසට ගිලා බැස තිබු අතර වර්ෂා කාලයේදී වැවට සේදී යැමේ අවධානමක් පැවතුණි. එසේ වුවද 2023 දෙසැම්බර් 31 දින දක්වා වැඩ අවසන් කර මාස 6 ක් ගත වන තුරු කිසිදු වගා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර නොතිබුණි. | | |
| (ඇ) | **කෘෂිකර්ම අමාත්‍යාංශයේ පොහොර සහනාධාරය ලබා දීම** | | |
| (i) | 2023 වර්ෂයේ යල කන්නයේ වී වගා කරන ගොවීන්ට පොහොර ලබාදීම සඳහා රු.11,147,000,000ක් වටිනා වවුචර්පත් 1,626,000 ක් එකක් සඳහා රු.3 ක මුද්‍රණ පිරිවැයක් දරා මුද්‍රණය කර තිබුණි. පොහොර අවශ්‍ය ගොවීන් නිශ්චිතව හඳුනාගත නොහැකි වීම නිසා රු.1,162,077,900 ක් වටිනා වවුචර් 211,583ක් අවලංගු වී තිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | ගොවීන්ට පොහොර නිකුත් කිරීම හා වවුචර්පත් බෙදාදීම පිලිබඳ පෙර සැලසුමක්ද පොහොර අවශ්‍ය ගොවීන් නිශ්චිතව හඳුනා ගැනීමද කල යුතුය. |
| (ii) | මඩකලපුව දිස්ත්‍රික්කයේ යළ කන්නය අප්‍රේල් සිට ජූලි 31 දිනට අවසන් වන අතර ගොවිජන සේවා මධ්‍යස්ථාන 16 කට යූරියා හා එම්.ඕ.පී කි.ග්‍රෑම් 464,530 කට අදාල පොහොර වවුචර් පත් ලබා දීම 2023 ජූනි මාසයේ මැද දක්වා ප්‍රමාද වී අස්වැන්න නෙලන කාලයට පොහොර ලබාදී තිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | නියමිත දිනට පොහොර වී වගාවට ලබා දීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | 2023 මැයි 24 දිනැති අංක දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ අංක 7/5/8-335-04 දරන ලිපියේ ii ඡේදය අනුව Agrarian.lk වෙබ් අඩවියට යල කන්නයේ වී වගා කරන ගොවීන්ගේ තොරතුරු ඇතුලත් කර ඒ අනුව වවුචර්පත් නිකුත් කිරීමට කටයුතු කළ යුතු බවට උපදෙස් ලබා දී තිබුණද මඩකලපුව, මාතලේ, නුවරඑළිය, කුරුණෑගල සහ මහනුවර දිස්ත්‍රික්ක වල පිහිටි ගොවිජන සේවා මධ්‍යාස්ථාය 65 ක් පටහැනිව කටයුතු කර තිබුණි.එසේම 2023/24 මහ කන්නයේ මූල්‍ය සහනාධාරය සඳහා එම වෙබ් අඩවියට මාතලේ දිස්ත්‍රික්කයේ පල්ලේපොල ගොවිජන සේවා කාරක සභාවේ මැනුම් කටයුතු සිදු කළ වසම් 14 ක ඉඩම් කැබලි 153 ක් 2024 ජනවාරි 10 වන විටත් පද්ධතියට උඩුගත කර නොතිබුණි. මැනුම් කටයුතු කර පද්ධතියට උඩුගත කළ ඉඩම් කැබලි 862 ක තොරතුරු නොපෙන්වන බවත් මෙතෙක් මැනුම් කටයුතු සිදු නොකළ කුඹුරු ඉඩම් 466 ක් සඳහා ඉඩම් නාම ලේඛනයේ තොරතුරු එම වෙබ් අඩවියට ඇතුලත් කරන ලෙසත් කොමසාරිස්වරයා දන්වා තිබුණි.ඒ අනුව ගොවීන්ගේ ඉඩම් ප්‍රමාණය හඳුනා ගැනීම සඳහා ඒකාකාරී ක්‍රමයක් භාවිතා නොවන නිසා සහනාධාර ලබාදීමේ කාල පමාවක් පැවතුනි. | 2023/24 මහ කන්නයේ වී වගා කරනු ලබන ගොවීන් වෙත මූල්‍ය සහනාධාරය ලබාදීමට අදාළ තොරතුරු යාවත්කාලීන කරන ලද්දේ ඒ සඳහා දෙපාර්තමේන්තුව විසින් ලබා දුන් උපදෙස් පරිදි බව හා අදාළ දත්ත පද්ධති වලට ගැටළු මතුවූ අවස්ථාවල පොතුහැර තොරතුරු කළමනාකරණ ඒකකය වෙත දන්වා ලැබෙන උපදෙස් පරිදි කටයුතු කර ඇති බව. | GEO GOVIYA දත්ත පද්ධතිය කඩිනමින් අවසන් කර Agrarian.lk වෙබ් අඩවියට යාවත්කාලීන කර එම වෙබ් අඩවියට ඇතුළත් කළ ගොවීන්ට පමණක් පොහොර නිකුත් කළ යුතුය. |
| (iv) | මඩකලපුව දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන 16 ක ගොවීන් 32,563 කට රු. 534,404,100 ක මුදලක් මහ කන්නයේ ආරම්භක මාසය වන ඔක්තෝබර් මාසයේදී ලබාදී නොතිබීම නිසා වී වගා කළ ගොවීන්ට පොහොර අවශ්‍ය වේලාවට ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | මූල්‍ය සහනාධාර අවශ්‍ය අවස්ථාවට ලබා දීම කළ යුතුය. |
| (v) | මාතලේ දිස්ත්‍රික්කයේ 2023/24 මහ කන්නයේ වී වගා කිරීම සඳහා කුඹුරු හෙක්ටයාර 21,766 ක ඉලක්කයක් හඳුනාගෙන ඉන් කුඹුරු හෙක්ටයාර 14,366 ක් සඳහා මූල්‍යමය සහනාධාර ලබාදීමට ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් | කන්නය ආරම්භ වීම ගොවිජන සේවා බල ප්‍රදේශ මට්ටමින් වෙනස් වන අතර වගා කිරීම අනුව අදාළ තොරතුරු ඇතුලත් කිරීම සිදු කරන ලද බව හා මුදල් නිකුත් කිරීම සිදු කරන ලද්දේ මහ භාණ්ඩාගාරය විසින් අක් මුදල් නිදහස් කිරීම අනුව බව තවද | මූල්‍ය සහනාධාර අවශ්‍ය අවස්ථාවට වගා කළ ගොවීන් හඳුනාගෙන ලබා දීම කළ යුතුය. |

| | |
|---|---|
| කාර්යාලය මඟින් අනුමත කර 2024 ජනවාරි 23 දින වන විට කුඹුරු හෙක්ටයාර 12,739 ක් වගා කළ ගොවීන් වෙත රු. 191,088,621 ක මුදලක් නිකුත් කර තිබුණි. ගොවිජන සේවා කාරක සභා මට්ටමින් ලැබිය යුතු තොරතුරු 2023 දෙසැම්බර් 31 දින වන විටත් ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලයට ලබා දී නොතිබුණු බැවින් නියමිත වගා කන්නය තුළ හෙක්ටයාර 1,627 කට මූල්‍ය සහනාධාරය ලබා දීමට නොහැකිවී තිබුණි. | ගොවීන්ගේ බැංකු ගිණුම් යාවත්කාලීන නොවීම, ගිණුම් විවෘත කිරීමේ ගැටළු, කන්න අනුව ගොවියා මාරු වී තිබීම, එක් කෘ.ප.නි.ස. නිලධාරියකු වසම් කිහිපයක රාජකාරී ඉටු කිරීම මත මධ්‍යස්ථාන මට්ටමින් තොරතුරු ලැබීම ප්‍රමාද වී ඇති බව. |

**2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.**

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **වටිනාකම රු.** | **අනුකූල නොවීම** | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| (i) | මු.රෙ. 104(2) | 978,013 | නැතිවීම්/පාඩු වීම් වටිනාකම රු. 50,000 කට වැඩිනම් ඒ වාර්තාවේ පිටපතක් භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යැවිය යුතු වුවත් 2023 මාර්තු 02 දින වන විටත් රු.978,013 ක මුරපොළ (Checkpoint) 3200 මාදිලියේ ගිනි පවුර උපකරණය (Firewall) අස්ථානගත වීම පිළිබඳව පිටපතක් භාණ්ඩාගාරය වෙත යොමු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් නීතිමය කටයුතු සඳහා CIBII 361/116 දරණ පැමිණිල්ලේ පිටපතක් ඉල්ලා 2024.03.22 දින පොලිස්පති වෙත ලිපියක් යොමු කර ඇත. තවද මේ සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් හඳුනා ගැනීම සඳහා මු.රෙ 104 පරීක්ෂණය සිදු කිරීම සඳහා 2024.04.16 දිනැතිව නිලධාරීන් පත් කර ඇත. එම වාර්තාව ලද පසු පිටපතක් භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කරනු ලැබේ. | අලාභයට වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන අලාභය අයකර ගැනීමට සහ භාණ්ඩාගාරය වෙත වාර්තා කිරීම කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ii) | මු.රෙ. 396(ඈ) | 2,124,082 | නිකුත් කර මාස 06 කට වැඩි ගෙවීම් සඳහා ඉදිරිපත් වී නොමැති චෙක්පත් 136 ක් සම්බන්ධයෙන් මු.රෙ. පරිදි කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) | මු.රෙ. 571 | 14,266,459 | වසර 02 ක් ඉක්මවූ රු.14,266,459 ක මුදල සම්බන්ධයෙන් මු.රෙ.පරිදි කටයුතු කර නොතිබුණි. | භාණ්ඩාගාර අක්මුදල් ලද විගස නිරවුල් කිරීම කරනු ලැබේ. ITMIS පද්ධතිය හරහා භාණ්ඩාගාරයෙන් අක්මුදල් ඉල්ලුම් කරන ලෙසත් හා එලෙස රික්විෂිෂන් පත්‍ර ඉදිරිපත් නොවන තැන්පතු රාජ්‍ය අදායමට බැර කර ලෙසත් සියලු දිස්ත්‍රික් කාර්යාල වලට උපදෙස් ලබා දෙන ලදී. | වර්ෂ 02 ඉක්ම වූ තැන්පතු නියාදනය කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 12.1 වගන්තිය | 9,238.699 | නිලධාරියෙකුට අතිරේක පාරිශ්‍රමිකයක් ගෙවන්නේ නම් ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගත යුතු වුවත් සුහුරු වාරි ව්‍යාපෘතිය වෙනුවෙන් සහ තුම්බිකුලම වැව ප්‍රතිසංස්කරණ වෙනුවෙන් දෙපාර්තමේන්තුවට ලද සීයයට 01 ක් වූ පරිපාලන වියදමින් නිලධාරින්ගේ වැටුපෙන් 1/3 ක් වූ දීමනාවක් නිලධාරීන් 38 කට රු. 9,238,699 ක් ද වශයෙන් අතිරේක පාරිශ්‍රමිකයක් ලෙස ගෙවා තිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගත යුතුවේ. |
| (ඇ) | 2021 සැප්තැම්බර් 29 දිනැති අංක PED/PMD/Cir/2021/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 11,851,202 | ප්‍රජා පාදක සංවිධාන සඳහා ලබාදෙන කොන්ත්‍රාත් උප කොන්ත්‍රාත් නොදිය යුතු වුවත් කොන්ත්‍රාත් වටිනාකම රු. 11,851,202 ක් වූ මහනුවර දිස්ත්‍රික්කයේ ගොඩකවෙල රජ ඇළ සහ වැව් අමුණු ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති 04 | පිළිතුරු ලැබී නොමැත. | චක්‍රලේඛය පරිදි කොන්ත්‍රාත් උප කොන්ත්‍රාත් නොදිය යුතුය. |

| | | |
|---|---|---|
| | ක් සම්බන්ධයෙන් එම චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව කටයුතු කර නොතිබුණි. | |

## 2.5 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2012 පෙබරවාරි 29 දින දෙපාර්තමේන්තුව විසින් ගොවි බැංකු කටයුතු මෙහෙයවීම සඳහා 2012 පෙබරවාරි 29 දින අංක 04/2012 දරණ චක්‍රලේඛය ප්‍රකාරව "ජාතික මෙහෙයුම් කමිටුව" නමින් කමිටුවක් පත්කර ඇතත්, එම කමිටු නිලධාරීන් කවුරුන්ද, වගකීම් හා කාර්යයන් මොනවාද යන්න සහ ගොවි බැංකු පාලනය කරන ආකාරය අදාළ චක්‍රලේඛය තුළ ඇතුලත් කර නොතිබුණි. එසේම ප්‍රධාන කාර්යාලයේ පවත්වාගෙන යනු ලබන ගොවි බැංකු අංශයේ මූල්‍යමය හා මූල්‍යමය නොවන ගනුදෙනු පිළිබඳව වාර්තා කිරීමට අදාළව නෛතික ප්‍රතිපාදන එහි සඳහන් කර නොතිබුණි. එසේ වුවද භාණ්ඩාගාරයේ අනුමැතියෙන් තොරව ආරම්භ කල බැංකු ජංගම ගිණුමේ 2023 දෙසැම්බර් 31 දිනට බැංකු ශේෂය රු.62,727,222 ක් වූ අතර ස්ථාවර තැන්පත්වල ආයෝජන රු.120,000,000 ක්ද ඒ සඳහා ලද පොලිය රු. 19,340,019 ක්ද ලැබී තිබුණි. එම තොරතුරු මූල්‍ය ප්‍රකාශන වල හෙලිදරව් කර නොතිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | භාණ්ඩාගාර අනුමැතියක් මත ඔවුන්ගේ වගකීම් හා කාර්යයන් ලිඛිතව සනාථ කර මූල්‍ය ප්‍රකාශන වල හෙලිදරව් කල යුතුය. |

## 2.6 තැන්පතු

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මොනරාගල දිස්ත්‍රික්කයේ තණමල්විල සාගිනි වැව සෑදීම වෙනුවෙන් ආහාර ප්‍රවර්ධන මණ්ඩලයෙන් 2021 දෙසැම්බර් 20 දින ලද රු. 400,000 ක මුදල අදාළ කාර්යය සඳහා යෙදවීමකින් තොරව 2023 දෙසැම්බර් 31 දින වන විටත් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | තණමල්විල සාගිනි වැව සෑදීම වෙනුවෙන් ආහාර ප්‍රවර්ධන මණ්ඩලයෙන් ලද රු. 400,000 මොනරාගල දිස්ත්‍රික් කාර්යාලයේ පොදු තැන්පතු ගිණුමේ රඳවාගෙන ඇත. | සියලුම තැන්පත් ප්‍රධාන කාර්යාලයේ පොදු තැන්පත් ගිණුමේ රඳවා අදාල කාර්යයට යෙදවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2022 දෙසැම්බර් 14 දින රිසිට් අංක 627378 මගින් එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර වැඩසටහන මගින් ව්‍යාපෘති කටයුතු වෙනුවෙන් ලැබී තිබුණු රු. 1,442,000 ක මුදල මාස 06 ක් පොදු තැන්පත්වල රඳවාගෙන අදාළ ව්‍යාපෘතියේ අවසරයකින් තොරව ඩීසල් සහනාධාර සඳහා වවුචර්පත් මුද්‍රණ කටයුතු වෙනුවෙන් රු. 1,305,602 ක මුදලක් ගෙවා තිබුණි. | එක්සත් ජාතින්ගේ ලෝක ආහාර වැඩසටහන හා ඩීසල් සහනාධාර වැඩසටහන යන ව්‍යාපෘති දෙකම එකම කාලවකවානුවක් තුළ ක්‍රියාත්මක වූ අතර කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය ප්‍රකාරව ඩීසල් සහනාධාර වැඩසටහන සඳහා ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙතින් දරණ ලද මුද්‍රණ වියදම පියවා ගැනීම සඳහා අදාල මුදල් භාවිතා කරන ලදී. | ව්‍යාපෘති සඳහා ලැබී ඇති මුදල් ඒ සඳහා යෙදවිය යුතුය. |

2.7 **බැංකු ගිණුම් මෙහෙයවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් කාර්යාල වෙත චෙක්පත් 65 කින් ලද වටිනාකම රු.14,238,084 ක් බැංකු සැසඳුම් වල හඳුනා නොගත් ශේෂය තුළ දක්වා ඇතත් ඒවා විධිමත්ව හඳුනාගෙන ආදායමට ගෙන නොතිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | චෙක්පත් කඩිනමින් හඳුනාගෙන ආදායමට ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | **සුළු වාරිමාර්ග හා පුරන් කුඹුරු අස්වැද්දවීමේ වැඩසටහන** | | |
| (i) | සුළු වාරිමාර්ග හා පුරන් කුඹුරු අස්වැද්දවීමේ වැඩසටහන යටතේ දිස්ත්‍රික්ක 25 ආවරනය වන පරිදි සුහුරු ගම්මාන වැඩසටහන යටතේ හරිත ගෘහ ඉදිකිරීම සඳහා රු.375,000,000 ක ප්‍රතිපාදන වෙන්කර ඇතත්,එය දිස්ත්‍රික්ක 16 ක පමණක් ක්‍රියාත්මක කර ඒ සඳහා රු.151,320,000 ක ප්‍රතිපාදන මත හරිත ගෘහ 291 ක් ඉදි කිරීම සඳහා යෝජිතව තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී හරිත ගෘහ 145 ක ඉදිකිරීම් ආරම්භ කර එහි ඉදිකිරීමේ ප්‍රගතිය සියයට 49 ක් විය. | පිළිතුරු ලැබී නොමැත. | ප්‍රතිපාදන උපරිම ලෙස උපයෝජනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | කුරුණෑගල දිස්ත්‍රික්කයේ හරිත ගෘහ ඉදිකිරීම සඳහා වගාකරුවන් 21 දෙනෙකු විසින් 2023 ඔක්තෝබර් 28 දින සිට 2023 දෙසැම්බර් 13 දින දක්වා කාලය තුළ රු.500,000 බැගින් යොදා ගිවිසුම්වලට එළඹ තිබුණද වගා කටයුතු ආරම්භ නොකිරීම නිසා ආදායම් ලැබීමට ප්‍රමාදී වී තිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | ප්‍රමාදයකින් තොරව ව්‍යාපෘති ආරම්භ කළ යුතුය. |

### 3.2 වාර්ෂික කාර්ය සාධන වාර්තාව

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය හා 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තා පිළියෙල කර ගිණුම් සමඟ විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තා කෙටුම්පත පිළියෙළ කර මූල්‍ය ප්‍රකාශන සමඟ විධිමත්ව විගණනය වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ. ඉදිරියේදී වාර්ෂික කාර්යසාධන වාර්තා පිළියෙළ කර ගිණුම් සමඟ විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | වාර්ෂික කාර්යසාධන වාර්තා කෙටුම්පතක් පිළියෙල කර ගිණුම් සමඟ විගණනය වෙත ඉදිරිපත් කල යුතුය. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/ 2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික කාර්යසාධන වාර්තා පිළියෙල කර විගණන වාර්තාවද ඇතුළත් කරමින් සියලුම ගණන්දීමේ නිලධාරීන් විසින් වාර්ෂික කාර්යසාධන වාර්තා භාෂාත්‍රයෙන් සකස් කර මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ගතවීමට පෙර සභාගත කිරීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවත් දෙපාර්තමේන්තුවේ 2019, 2020, 2021 සහ 2022 වර්ෂවල වාර්ෂික කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි. | 2019 වර්ෂයේ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. 2020, 2021 හා 2022 වර්ෂවල කාර්යසාධන වාර්තා සකස් කර කෙටුම්පත් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. 2023 වර්ෂයේ කාර්යසාධන වාර්තාව සකස් කිරීමේ කටයුතු අවසන් අදියරේ පවතී. | වාර්ෂික කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කල යුතුය. |

**3.3 විදේශ ආධාර ව්‍යාපෘති**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකාවේ වියලි කලාපයේ වර්ෂාව අඩු කාලවලදී අවම ජල ප්‍රමාණයකින් වගා කිරීමට සහ පවතින බලශක්ති අර්බුදයට විසඳුම් ලෙස සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන ජල පොම්ප හා බිංදු ජල තාක්ෂණය යොදා ගැනීම සඳහා 2005 – 2008 වර්ෂවලදී විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත රු. 2,327,272,272 ක ලබාදුන් ප්‍රතිපාදනවලින් ගොවිජන සේවා මධ්‍යස්ථාන 19 කට සූර්යබල සූක්ෂම ජල පද්ධති 7,231 ක් ලබා දී තිබුණි. 2018 වර්ෂය අවසන් වන විට සියලුම මුදල් අයකර අවසන් කළ යුතු බව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් විසින් 2020 ජූලි 03 දිනැති ලිපිය මගින් අයවිය යුතු මුදල රු. 2,261,226,463 ක් බව සඳහන් කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට ලබා දී තිබුණු පද්ධතිවලින් සියයට 90 ක් අස්ථානගතව, අභාවිතව, ගොවීන්ගේ තොරතුරු සොයාගත නොහැකිව සහ අක්‍රීයව පැවතුණි. | පිළිතුරු ලැබී නොමැත. | ගිවිසුම් අනුව අයවිය යුතු මුදල් අය කර අස්ථානගත පද්ධති සම්බන්ධව පරීක්ෂණ පැවැත්විය යුතුය. |
| (ආ) | ලෝක බැංකු ණය ආධාර යටතේ කොවිඩ් 19 හදිසි තත්ත්වය මත ගබඩා පහසුකම් ඇති කිරීම වෙනුවෙන් 2021 වර්ෂයේදි ලද රු.113,847,389 ක ප්‍රතිපාදන උපයෝගී කරගෙන දිස්ත්‍රික් කාර්යාල 06 ක ගබඩා 11 ක් 2023 මැයි 31 දින වැඩ අවසන් කර තිබුණද එම ගබඩා 2024 පෙබරවාරි 29 දින දක්වා නිෂ්කාර්ය වත්කම් ලෙස පැවතුණි.අනුරාධපුර දිස්ත්‍රික්කයේ මැදවච්චිය ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ගබඩා ඉදිකිරීම් කටයුතු 2023 මැයි 31 දිනට අවසන් කර නොතිබීම හේතුවෙන් ඒ සඳහා වූ ඉතිරි ප්‍රතිපාදන මුදල ලැබී නොතිබීම නිසා දැනට දරන දරන ලද රු. 2,464,454 ක් නිශ්කාර්ය වියදමක් විය. | පිළිතුරු ලැබී නොමැත. | ගබඩා සියල්ලම භාවිතයට ගත යුතුය. ඵලදායි නොවන ව්‍යාපෘති ක්‍රියාත්මක නොකල යුතුය. |
| (ඇ) | ලෝක බැංකු ආධාර යටතේ 2022 වර්ෂයේදී දේශගුණික සුහුරු කෘෂිකර්ම ව්‍යාපෘතිය ක්‍රියාත්මක දිස්ත්‍රික්ක 10 ක ගොවිජන සේවා මධ්‍යස්ථාන 47 ක් සඳහා රු. 248,658,432 ක් වටිනා බීජ වී සිටුවීමේ යන්ත්‍ර 94 ක්,ගොයම් පැළ සිටුවීමේ යන්ත්‍ර 188 ක්, වල් පැලැටි නෙලීමේ යන්ත්‍ර 188 ක්, රෝද 04 ට්‍රැක්ටර් 01 ක් සහ වී අස්වනු නෙලීමේ යන්ත්‍ර 04 ක් බෙදා දී තිබුණු අතර සියළුම බීජ සිටුවීමේ යන්ත්‍ර සහ | පිළිතුරු ලැබී නොමැත. | භාවිතයට ගත නොහැකි උපකරන නැවත අදාල ආයතන වෙත බාර දීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වල් නෙලීමේ යන්ත්‍ර 2022 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා භාවිතයට ගෙන නොතිබුණි. නියමු ව්‍යාපෘතියක් ලෙස ගොයම් පැළ සිටුවීමේ යන්ත්‍ර භාවිතය කර ඒවා ප්‍රමිතියට නොගැලපීම නිසා එම යන්ත්‍ර 188 භාවිතයෙන් ඉවත් කර නිෂ්ක්‍රියව පැවති අතර ඒ වෙනුවෙන් වැය කරන ලද රු.214,529,432 ක වියදම නිෂ්කාර්ය වියදමක් විය. භාවිතයට ගත හැකි අස්වනු නෙලීමේ යන්ත්‍ර 04 හා රෝද 04 ට්‍රැක්ටරය ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙත ලබා නොදී රාජ්‍ය හා පෞද්ගලික හවුල් ව්‍යාපාර (PPP) කළමනාකාරිත්වය යටතේ පවත්වාගෙන යනු ලබන ගොවිපොළ යන්ත්‍රෝපකරණ උපාංග ඒකකය වෙත ලබා දී තිබුණි. | | |
| (ඇ) | ලෝක බැංකු ණය ආධාර යටතේ කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන (SAPP) මගින් සත්ව නිෂ්පාදකයින්ගේ ආහාර හිඟයට පිළියමක් ලෙස හා බඩඉරිඟු ආනයනය සඳහා යන විදේශ විනිමය ඉතුරු කර ගැනීමේ අරමුණින් අම්පාර, අනුරාධපුරය, බදුල්ල, මොනරාගල සහ හම්බන්තොට යන දිස්ත්‍රික්ක 05 හි අක්කර 40,000 ක බඩඉරිඟු වගා කිරීමට අරමුණු කළද මහ කන්නයෙන් පසුව මෙම බඩඉරිඟු ව්‍යාපෘතිය දිගින් දිගටම ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදයක් නොතිබීම හේතුවෙන් ව්‍යාපෘති අරමුණු වූ සත්ව නිෂ්පාදකයින්ගේ ආහාර හිඟයට පිළියමක් ලැබී නොතිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | ව්‍යාපෘති අරමුණු වූ සත්ව නිෂ්පාදකයින්ගේ නිෂ්පාදනයට අවශ්‍යය බීජ හිඟයට පිළියමක් ලෙස මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

3.4 **දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති**

| | විගණන නිරීක්ෂණය | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම අනුව පුරන් කුඹුරු අක්කර 3809 ක් අස්වැද්දීම සඳහා රු.මිලියන 162,815,691 ක ප්‍රතිපාදන වෙන්කර ඇතත් අක්කර 2986 ක් පමණක් අස්වැද්දීමට කටයුතු කර රු.137,616,325 ක් වියදම් දරා තිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | ප්‍රතිපාදන උපරිම ලෙස ප්‍රයෝජනයට ගත යුතුය. |
| (i) | පොළොන්නරුව ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය විසින් සුළු වාරිමාර්ග හා පුරන් කුඹුරු යටිතල පහසුකම් සංවර්ධන වැය විෂයය යටතේ රු.4,558,012 වැයකර රඹවැව වැවෙහි වැඩ අවසන් කර තිබුණ ද එම ප්‍රතිසංස්කරණය මතින් අලීන් ගමන් කිරීම නිසා වැව් බැම්ම කැඩී සේදී ගොස් තිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | ප්‍රතිසංස්කරණ යට පෙර ඇතිවිය හැකි ආපදාවන් පිළිබඳ සොයා බැලිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | පානදුර හා නාගොඩ ගොවිජන සේවා මධ්‍යස්ථානයන්ට සම්බන්ධ වසම් 04 කට අදාලව කුඹුරු අක්කර 25 ක ප්‍රමාණයක් අස්වැද්දීම වෙනුවෙන් රු.1,180,172 ක මුදලක් 2023 දෙසැම්බර් 31 දින වන විට අදාල ගොවි සංවිධාන වෙත ගෙවා තිබුණද 2023 වර්ෂයේ මහ කන්නයට එම කුඹුරු කිසිවක් වගා කර නොතිබුණි. බණ්ඩාරගම ගොවිජන සේවා මධ්‍යස්ථානයට අදාල පඩවන් වෙල් යාය අක්කර 23 ක් වගා කිරීමේ ඉලක්ක කර තිබුණද 2023 මහ කන්නයට අක්කර 7 ක කුඹුරු ප්‍රමාණයක් පමණක් වගා කර තිබූ නමුත් සම්පූර්ණ අක්කර 23 ට අදාල රු. 1,710,419 ක මුදලක් ගොවි සංවිධාන වෙත ගෙවා තිබුණි. නාගොඩ ගොවිජන සේවා මධ්‍යස්ථානයට අයත් වසම් 3 කට අදාලව කුඹුරු අක්කර 55 ක් අස්වැද්දීම වෙනුවෙන් ගොවි සංවිධාන වෙත එකතුව රු. 341,615 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණද එම පුරන් කුඹුරු වලින් සියයට 30 කට අඩු ප්‍රමාණයක් පමණක් අස්වද්දා තිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | කුඹුරු අස්වැද්දීම සම්බන්ධයෙන් පසු විපරම් සිදු කළ යුතුය. |
| (iii) | ගම්පහ දිස්ත්‍රික්ක කාර්යාලට පුරන් කුඹුරු නැවත වගා කිරීම සඳහා රු.9,940,557 ක් ප්‍රතිපාදන ලබා දී ව්‍යාපෘති 91 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි ද ව්‍යාපෘති 03 ක පමණක් වැඩ අවසන් කර තිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | ප්‍රතිපාදන උපරිම ලෙස ප්‍රයෝජනයට සැලසුම් කල යුතුය. |
| (ආ) | ගංවතුර හානි යටතේ ව්‍යාපෘති 180 ක් ඉටු කිරීම සඳහා රු. මිලියන 198 ක් ප්‍රතිපාදනය කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘති 173 ක් පමණක් නිමකර තිබුණු අතර ව්‍යාපෘති 06 ක වැඩ අවසන් කර නොතිබුණි. නිමකර තිබුණු ව්‍යාපෘති සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.176,521,549 ක වියදමක් දරා තිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | ක්‍රියාකාරී සැලැස්ම අනුව කටයුතු කළ යුතුය. |
| (i) | මහනුවර දිස්ත්‍රික් කාර්යාලයට අයත් හුළුගඟ අරත්තන උඩ ඇළ ගංවතුර හානි ව්‍යාපෘති යටතේ රු.2,095,599 ක මුදලකට ගිවිසුම්ගත වී කොන්ක්‍රීට් කුලුනු 09 ක් මීටර් 6.8 ක් උසින් යුතුව ඉදි කිරීමට ඇස්තමේන්තු කර තිබුණද එම කුලුනු පොළොව මට්ටමේ සිට මී. මීටර 3,070 සිට 3,880 දක්වා ඉංජිනේරු ඇස්තමේන්තුවේ නොමැති විවිධ උස මට්ටම්වලින් පැවති අතර ඉංජිනේරු ඇස්තමේන්තුව නොමැති බීම් එකක් මිලි මීටර් 300X300 ප්‍රමාණයෙන් මීටර් 22 දක්වා දුරට ඉදිකර තිබුණද ඒ වෙනුවෙන් සංශෝධිත ක්‍රියාකාරී ඇස්තමේන්තුවක් සකස් කර අනුමත කරගෙන නොතිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | ඉංජිනේරු ඇස්තමේන්තුව අනුව කටයුතු කළ යුතුය. |
| (ii) | ගංවතුර හානි ව්‍යාපෘතිය යටතේ මහනුවර දිස්ත්‍රික් කාර්යාලයට අයත් මැදපිටිය ගොඩවෙල රජ ඇළ ඉදි කිරීමට රු. 2,472,000 ක ඇස්තමේන්තුවක් මත සිදුකර තිබුණි. පැරණි ඇළ මාර්ගයට නව ඉදිකිරීම් සම්බන්ධ වන ස්ථානය හා එම ස්ථානයේ සිට අලුතින් ඉදිකරන ලද ඇළ මාර්ගයේ මීටර් 04 ක් පමණ දුරින් ජලය කාන්දුවීම් මෙන්ම ඉංජිනේරු ඇස්තමේන්තුවේ ඉදි කිරීමට සැලසුම් කළ කොන්ක්‍රීට් කුලුනු 09 ක් වෙනුවට කුලුනු 08 ක් පමණක් ඉදිකර තිබූ අතර මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | ඉදි කිරීම් ප්‍රමිතිය සහා ඉටුකල කාර්යය පරීක්ෂා කර ගෙවීම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | තිරසර ජාතික ආහාර සුරක්ෂිතතාවය උදෙසා කෘෂිකාර්මික ඉඩම් කාර්යක්ෂමව යෙදවීම සහ යටිතල පහසුකම් සැපයීම තුළින් ඵලදායීතාව ඉහළ නැංවීමේ සංවර්ධන වැඩසටහන යටතේ පැරෂුට් ක්‍රමය භාවිතයෙන් කුඹුරු අක්කර 6,682 ක වී වගා කිරීම් සඳහා ක්‍රියාකාරී සැලැස්ම අනුව රු. 200,000,000 ක ප්‍රතිපාදන මුදලක් වෙන්කර තිබුණි. රජයේ දායකත්වය ලෙස රු.144,451,604 ක වියදමක් දරා පැරෂුට් තැටි 3,265,800 ක් ගොවීන් වෙත බෙදා දුන් බව සඳහන් වුවද ගොවීන් වෙත ලබාදී තිබුණු පැරෂුට් තැටි ප්‍රමාණය 2,817,815 ක් වන අතර 2023 දෙසැම්බර් 31 දිනට ගොවීන්ගෙන් රු.48,154,221 ක මුදලක් අයවිය යුතු වුවත් ඉන් රු.20,786,974 ක් අයවී නොතිබුණි.2023 දෙසැම්බර් 31 දින වන විටත් දිස්ත්‍රික් කාර්යාල වෙත ලබාදුන් පැරෂුට් තැටි 447,985 ක් ගොවීන් වෙත බෙදා දීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | දිස්ත්‍රික් කාර්යාල සතු පැරෂුට් තැටි සියල්ලම ගොවීන් වෙත බෙදා දී අදාළ මුදල් අය කර ගත යුතුය. |
| (ඇ) | ක්‍රියාකාරී සැලැස්ම අනුව සුළු වාරිමාර්ග සුළු අලුත්වැඩියා (Kickstart) ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘති 526 ක් ඉටු කිරීම සඳහා රු. මිලියන 188 ක් වෙන්කර තිබුණද 2023 දෙසැම්බර් 31 දින වන විට ඉන් ව්‍යාපෘති 16 ක වැඩ අවසන් කර නොතිබුණු අතර සැලසුම් කළ ව්‍යාපෘති 02 ක් ඉටුකර නොතිබුණි. මෙම ව්‍යාපෘති සඳහා රු.187,314,543 ක ප්‍රතිපාදන මුදලක් නිදහස් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වියදම රු. 176,444,021 ක් විය. | පිළිතුරු ලැබී නොමැත. | ක්‍රියාකාරී සැලැස්ම අනුව සැලසුම් කළ ව්‍යාපෘති නිම කළ යුතුය. |
| (ඉ) | ක්‍රියාකාරී සැලැස්ම අනුව රු. මිලියන 216 ක මුදලක් වෙන්කර අත්හැර දමන ලද වැව් 20 ක් ප්‍රතිසංස්කරණයට සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී ව්යාපෘති 11 ක් පමණක් නිමකර තිබුණු අතර ව්‍යාපෘති 09 ක වැඩ අවසන් කර නොතිබුණි. අත්හැර දමන ලද වැව් ප්‍රතිසංස්කරණයට රු. 216,568,309 ක ප්‍රතිපාදනයක් ලැබී ඉන් රු. 145,661,397 ක මුදලක් වියදම් දරා තිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | ක්‍රියාකාරී සැලැස්ම අනුව සැලසුම් කළ ව්‍යාපෘති නිම කළ යුතුය. |
| (ඊ) | කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාවල වැව සහ පාළුවැව වරාවැව ප්‍රතිසංස්කරණය වෙනුවෙන් ඇස්තමේන්තු වටිනාකම පිළිවෙලින් රු.13,393,000 ක් සහ රු.9,360,000 ක් යටතේ ප්‍රතිසංස්කරණය කළද ඒ සඳහා ලබාගත් වැලි, කොන්ක්‍රීට් ගල්, යන්ත්‍ර සූත්‍ර සහ පාළු වැව වරාවැව සඳහා යොදාගත් කොන්ක්‍රීට් මිශ්‍රණය විගණනය විසින් පරීක්ෂා කළ ඉල්ලීම් කිරීමෙන් පසු ලබාගත් වාර්තාව අනුව ප්‍රමිතිගත පරාසය තුළ නොමැති බවත්, එම ඉදිකිරීම් අපේක්ෂිත සම්පිණ්ඩන ශක්තියක් නොමැති බවත් තවදුරටත් නිරීක්ෂණය විය. | පිළිතුරු ලැබී නොමැත. | ලබා ගන්නා ද්‍රව්‍ය නියම ප්‍රමිතියට අනුකූල ද යන්න තහවුරු පරික්ෂාවක් සිදුකර ගෙවීම් කල යුතුය. |
| (උ) | කෘෂිකාර්මික ඉඩම් කාර්යක්ෂමව යෙදවීම සහ යටිතල පහසුකම් සංවර්ධනය යටතේ රොටහේන යාය කෘෂි මාර්ගයට වෙනත් සස්ථානයකින් පස් ප්‍රවාහනය කර යොදා නොතිබියදී පස් ඝන මීටර් 380 ක් යෙදූ බවට බිල් කර සාවද්‍ය ලෙස රු. 558,600 ක්ද තලකිරියාගම කෘෂි මාර්ගයේ බොරළු යොදා නොමැති ඝන මීටර් 52.29 ක කොටසක් වෙනුවෙන් සාවද්‍ය ලෙස බිල් කර රු.120,790 ක් ද, සියඹලන්කොරටුව කෘෂි | පිළිතුරු ලැබී නොමැත. | සත්‍ය ලෙස ඉටු නොකළ සේවා සඳහා ගෙවීම් නොකළ යුතුය. |

මාර්ගයේ සංවර්ධනය නොකළ මීටර් 200 ක් වෙනුවෙන් සාවද්‍ය මිනුම් දක්වමින් රු. 145,728 ක් ද නොමිලේ සපයාගත් බොරළු මිලදී ගත් බවට සාවද්‍ය ලෙස දක්වමින් රු. 305,280 ක් ද මාර්ගය වෙත සපයා නොමැති බොරළු ඝන මීටර් 76.8 ක් වෙනුවෙන් රු. 74,035 ක් ලෙස ඉටු නොකළ කාර්යයන් වෙනුවෙන් එකතු වටිනාකම රු. 1,204,433 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

### 3.5 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලෝක ආහාර ව්‍යාපෘතියෙන් දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබූ CR–0098 දරන ජීප් රථය 2015 වර්ෂයේ ලියාපදිංචිය සිදුකර භාවිතයට නොගෙන එම වර්ෂයේ සිටම මාලඹේ රථවාහන අංගනයේ ගාල් කර තිබුණි | අංක 7/6/4/1/CR-0098 හා 2023.10.23 දිනැතිව එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර වැඩපිළිවෙළෙහි ශ්‍රී ලංකා නියෝජිත වෙත මෙම රථය ලියාපදිංචි කර ගැනීමට අපහසු බැවින් නැවත එම ආයතනයට භාර ගැනීමට අදාලව කටයුතු කරන ලෙස දන්වා ඇත. | භාවිතයට ගත නොහැකි නම් සුදුසු කටයුත්තක් කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා මධ්‍යස්ථාන 25 ක රෝද 04 ට්‍රැක්ටර් 47 ක්, රෝද 02 ට්‍රැක්ටර් 12 ක්, ට්‍රැක්ටර් ට්‍රේලර් 62 ක්, ගොයම් කපන යන්ත්‍ර 56 ක්, තැටි නඟුළු / කොකු නඟුලු 120 ක්, මඩවීල් 224 ක්, සංයුක්ත අස්වනු නෙළන යන්ත්‍ර 08 ක් සහ වෙනත් උපකරණ 565 ක් ආදී වත්කම් වර්ෂ 07 සිට වර්ෂ 25 ක කාලයක සිට අක්‍රීයව, අවභාවිතව පැවතිණි. | මේ වනවිට රෝද 04 ට්‍රැක්ටර් 85, රෝද 02 ට්‍රැක්ටර් 15, ට්‍රැක්ටර් ට්‍රේලර් 28, තැටි නඟුල් 64, කොකු නඟුල් 71, මඩ වීල් 105, ගොයම් කපන යන්ත්‍ර 20, සංයුක්ත අස්වනු නෙලන යන්ත්‍ර 03 සහ වෙනත් 97 ක් අපහරණය කර ඇත. | සියලුම නිෂ්කාර්යව වත්කම් අපහරණය කළ යුතුය. |
| (ඇ) | 2020 මාර්තු 10 දිනැති සමීක්ෂණ මණ්ඩලය මඟින් වෙන්දේසි කිරීමට තීරණය කර තිබුණු වාහන අතරින් 02 ක් වෙන්දේසි නොකර, අලුත්වැඩියා කර නැවත භාවිතා කරන ලෙස 2020 සැප්තැම්බර් 21 දිනැති තක්සේරු මණ්ඩලය විසින් නිර්දේශ කර තිබුණද කිසිදු අලුත්වැඩියාවක් සිදු නොකර මාලඹේ රථ වාහන අංගනයේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම නිෂ්කාර්යව පැවතුණි. | පිළිතුරු ලැබී නොමැත. | අලුත්වැඩියාවන් සිදු නොකරන්නේ නම් වෙනත් ආයතනයකට පැවරීමේ හැකියාව සොයා බලා කටයුතු කළ යුතුය. |
| (ඈ) | ගොවිජන බැංකු නියමු ව්‍යාපෘතිය සහ ගොවිජන සේවා කාරක සභා සඳහා සකස් කෙරෙන කළමනාකරණ තොරතුරු පද්ධති මෘදුකාංගය ස්ථාපනය කල පසු දිවයින පුරා පිහිටි ගොවිජන බැංකු නියමු ව්‍යාපෘති වල හා ගොවිජන සේවා කාරක සභා වල පද්ධතිය ක්‍රියාත්මක කෙරෙන | ගොවි බැංකු හා කාරක සභා සඳහා සකස් කරන ලද මෘදුකාංග පද්ධතිය ක්‍රියාත්මක වීම අධීක්ෂණය සඳහා ප්‍රධාන කාර්යාලයේ ඉදි කරන ලද පාලන මැදිරිය සඳහා අදාල රූපවාහිනී යන්ත්‍ර මිල දී ගන්නා ලද අතර, මෙහෙයුම් මැදිරියේ කටයුතු කඩිනමින් | කළමනාකරණ තොරතුරු පද්ධති ස්ථාපනය කර මෙහෙයුම් මැදිරියේ කටයුතු කඩිනමින් ආරම්භ |

| | | | |
|---|---|---|---|
| | ආකාරය පිළිබඳව අධීක්ෂණය කිරීම සඳහා ප්‍රධාන කාර්යාලයේ ඉදිකිරීමට යෝජිත මෙහෙයුම් මැදිරිය වෙනුවෙන් අඟල් 65 සැම්සුන් (Samsung) වර්ගයේ ස්මාට් රූපවාහිනී යන්ත්‍ර 05 ක් රු.2,497,800 ක් ගොවිජන බැංකු අරමුදලින් මිලදී ගෙන තිබුණි. මෙම රූපවාහිනී යන්ත්‍ර වල වගකීම් කාලය වසර 01 ක් වන අතර වගකීම් කාලයෙන් මාස 08 ක් යන තුරුත් රූපවාහිනී යන්ත්‍ර භාවිතයට නොගෙන හා මෙහෙයුම් මැදිරියේ කටයුතු ආරම්භ නොකර පැවතිණි. | ආරම්භ කිරීමට නියමිතව ඇත. | කළ යුතුය. |
| (ඉ) | නාරාහේන්පිට අමතර කොටස් ගබඩාවේ ගබඩා භාරකරු විසින් හිතාමතා භාණ්ඩ ලැබීම් තොග පොත්වලට ඇතුළත් නොකර, නිකුත් නියෝග මගින් ටයර් නිකුත් කළ බව දැක්වීම හා ටයර් ශේෂයන් වැරදි ලෙස තුලනය කිරීම හේතුවෙන් 2021, 2022 හා 2023 ජූනි 12 දින දක්වා මිලදී ගෙන තිබුණු රු.2,135,679 ක් වටිනා ටයර් 58 ක් වංචනික ලෙස ඉවත් කර තිබුණි. එම අලාභය අයකර ගැනීමට හා ඒ සඳහා විධිමත් විනය පරීක්ෂණයන් පැවැත්වීමට 2024 අප්‍රේල් 31 දක්වා කටයුතු කර නොතිබුණි. | අදාල ඌණතාවයන් සම්බන්ධයෙන් කරුණු අනාවරණය වූ විගස ගබඩා භාරකරු වෙතින් ලිඛිතව විමසීම් කරන ලද අතර, 2023.06.12 දින නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් මඟින් ටයර් හා බැටරි තොග සත්‍යාපනයක් සිදු කරන ලදී. ඒ සම්බන්ධයෙන් ලද උපදෙස් ප්‍රකාරව වහාම ගබඩාව මුද්‍රා තැබීමට කටයුතු කළ අතර, 2023.06.30 දින කුරුඳුවත්ත පොලීසියේ පැමිණිල්ලක් ගොනු කිරීමට ද කටයුතු කර ඇත. ඒ අනුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු නාරාහේන්පිට වාහන අමතර කොටස් ගබඩාවට අනුයුක්තව සිටි ගබඩා භාරකරුගේ රාජකාරී කටයුතු සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ XLVII පරිච්ඡේදයේ 31:1:8 වගන්තිය හා 31:5:2 වගන්තියට අනුව අංක හා දිනැති ලිපිය මඟින් වහාම ක්‍රියාත්මක වන පරිදි වැඩ තහනම් කිරීමට කටයුතු කර ඇත. අදාල විගණන කරුණු සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කර නිවැරදි කිරීමට අදාලව ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලබන බවත් වැඩිදුරටත් දන්වා සිටිමි. | අලාභය අයකර ගැනීමට හා විධිමත් විනය පරීක්ෂණය කඩිනමින් සිදු කළ යුතුය. |
| (ඊ) | මහව යන්ත්‍රෝපකරණ අංගනයේ ගර්භිත වූ රෝද 02 ට්‍රැක්ටරය, රෝද 04 ට්‍රැක්ටර් ට්‍රේලරය, කොකු නගුල 10, ඇට පියලි කිරීමේ යන්ත්‍රය, 9 Tin Tiller යන්ත්‍රය, මඩ රෝද, රීපර් 04 ක් යන යන්ත්‍ර කොටස්, ඩෝසර් යන්ත්‍ර 05 ක් සහ හම්බන්තොට අංගනයේ ඩෝසර් යන්ත්‍ර 3 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | තක්සේරු මණ්ඩලය විසින් තක්සේරු වාර්තාව ලබා දී ඇති අතර, අදාල යන්ත්‍ර අපහරණය කිරීම සඳහා මේ වන විට ලංසු ලේඛන සකස් කර තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත යොමු කර ඇත. කඩිනමින් අපහරණය කර මූල්‍ය නොවන වත්කම් ලේඛනයෙන් ඉවත් කිරීමට පියවර ගනු ලැබේ. | කඩිනමින් අපහරණය කර මූල්‍ය නොවන වත්කම් ලේඛනයෙන් ඉවත් කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | මහව යන්ත්‍රාගාරයේ ක්‍රියාකාරී තත්ත්වයේ පවතින යන්ත්‍ර 04 ක් සහ හම්බන්තොට යන්ත්‍ර අංගනයේ යන්ත්‍ර 07 ක් සේවයේ යෙදවීම අවම මට්ටමක පවතින අතර DAS 69 කුඩා පස්තලන රෝලර් යන්ත්‍රය මිලදී ගත් දින සිටම සේවයේ යෙදවීමකින් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි. | පිළිතුරු ලැබී නොමැත. | පවත්නා යන්ත්‍ර උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | මහව යන්ත්‍රාගාරයේ ඇති යන්ත්‍රය 07 ක් අලුත්වැඩියා කර භාවිතා කිරීමේ හැකියාව තිබියදීත් එසේ නොකර නිෂ්ක්‍රියව පැවතුණි. | පිළිතුරු ලැබී නොමැත. | භාවිතා කළ හැකි යන්ත්‍ර කඩිනමින් අළුත්වැඩියා කළ යුතුය. |
| (එ) | 2020 මාර්තු 10 දින පැවති සමීක්ෂණ මණ්ඩල වාර්තාවේ නිර්දේශ අනුව අදාළ අමාත්‍යාංශවලින් පවරාගෙන අපහරණය කිරීමට තීරණය කළ වාහන 07 ක් පවරාගෙන අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | අපහරණය කිරීමට තීරණය කළ වාහන කඩිනමින් අපහරනය කළ යුතුය. |
| (ඒ) | 2018 වර්ෂයේදී ජල කළමනාකරණ අංශයට මිලදී ගත් එකතුව රු. 25,822,137 ක් වූ උපකරණ වල ඇතුලත් රු. 15,568,479 ක් වූ ජලයේ ප්‍රමිතිය මැනීමේ උපකරණ කට්ටලය මිලදී ගත් දින සිට නිශ්ක්‍රීයව පැවතුණි. | පිළිතුරු ලැබී නොමැත. | උපකරණ අවශ්‍යතාවය අනුව ප්‍රයෝජනයට ගැනීමේ හැකියාව පරීක්ෂා කල යුතුය. |

3.6 **මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2005/2006 මහ කන්නයේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ මඩාටුගම ගොවිජන සේවා මධ්‍යස්ථානයේ නිලධාරීන් 03 දෙනෙකුගෙන් අය කළ යුතු සහනාධාර පොහොර ඌනතාවය වූ රු. 32,542,242 ක් වූ අතර එක් නිලධාරියෙකුගෙන් අය කළ යුතු වටිනාකම රු.77,912 ක් පමණක් අය කරගෙන තිබුණි. ඉතිරි මුදල වූ රු. 32,464,330 ක මුදල 2024 මාර්තු 31 දින දක්වා අය කරගෙන නොතිබුණි. මෙම අලාභයෙන් රු. 16,193,208 ක අලාභයට වගකිව යුතු ගොවිජන සංවර්ධන නිලධාරියා සාමාන්‍ය ක්‍රමය යටතේ වයස 60 සම්පූර්ණ වීම මත විශ්‍රාම ගැන්වීම සිදුකර ඇතත් එම අලාභය විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 43(අ) යටතේ ඔහුගෙන් අයකර ගැනීමට කටයුතු | පිළිතුරු ලැබී නොමැත. | විශ්‍රාම නිලධාරියාගෙන් නීතිමය ක්‍රියාමාර්ග අනුව සහ අනිකුත් නිලධාරින්ගෙන් කඩිනමින් අලාභය අයකර ගැනීමටත්,කටයුතු කළ යුතුය. |

කරන ලෙස නීතිපති දෙපාර්තමේන්තුව විසින් දන්වා තිබුණද 2024 මාර්තු 31 දින දක්වා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.7 විගණන විමසුම් වලට පිළිතුරු ලබා නොදීම.**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව වෙත 2019 වර්ෂය සඳහා නිකුත් කළ විගණන විමසුම් 23 ක්ද, 2020 වර්ෂය වෙනුවෙන් විමසුම් 15 ක්ද, 2021 වර්ෂයේ වෙනුවෙන් විමසුම් 13 ක්ද 2022 වර්ෂයේ නිකුත් කළ විමසුම් 17 කට සහ 2023 වර්ෂයේ නිකුත් කළ විගණන විමසුම් 09 කට 2024 මැයි 29 දින දක්වාම පිළිතුරු එවා නොතිබුණි. | 2024.05.29 දින වන විට තව දුරටත් විගණන විමසුම් 74 කට පිළිතුරු ඉදිරිපත් කළ යුතුව ඇත. | විගණන විමසුම් සඳහා කඩිනමින් පිළිතුරු ඉදිරිපත් කළ යුතුය. |

3.8 **කළමනාකරණ දුර්වලතා**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවීන්ගේ භාරකාර අරමුදලින් 2015/2016 වර්ෂවලදී බඩඉරිඟු වගා කිරීම වෙනුවෙන් ලද රු.80,790,000ක් 2020/2021 වර්ෂවලදී විශේෂ බඩ ඉරිඟු වගා කිරීම වෙනුවෙන් ලද රු.200,000,000 සහ 2020 වර්ෂයේ දී බිත්තර වී ලබා ගැනීම වෙනුවෙන් ලද රු.25,000,000 ක මුදලින් පිළිවෙලින් රු.11,897,009 ක්ද රු.12,449,008 සහ රු. 4,306,145 ක් 2023 දෙසැම්බර් 31 දිනට අය විය යුතුව පැවතුණි. | 2015/2016 විශේෂ බඩඉරිඟු ව්‍යාපෘතිය ගොවීන්ගේ භාරකාර අරමුදලින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ තෝරාගත් ගොවීන් 5386 ක් සඳහා රු.මිලියන 80.79 ක මුදලක් ලබාදී ඇති අතර 2024.05.20 දිනට තවදුරටත් අයවියුතු මුදල රු.මිලියන 11.12 කි. ගොවීන් ගණන 1037 ක් වූ අතර විනිශ්චය සභා වෙත යොමු කර ඇත. එබැවින් අධිකරණ ක්‍රියාවලියක් පැවතීම හේතුවෙන් ණය අය කිරීමට නිශ්චිත කාල සීමාවක් ප්‍රකාශ කල නොහැක.<br>2020/21 වර්ෂයේ මහ කන්නයේ ගොවින්ට බඩඉරිඟු වගා කිරිම සඳහා ගොවීන්ගේ භාරකාර අරමුදලෙන් ලබාදුන් රු.මිලියන 200 ක මුදලින් 2024.05.20 දින වන විට රු.මිලියන 188.75 ක මුදලක් අයකර ගෙන ඇති අතර මොණරාගල දිස්ත්‍රික්කයේ, ගොවිජන සේවා මධ්‍යස්ථාන 04 කින් පමණක් රු.මි.11.25 ක මුදලක් තවදුරටත් අයවිය යුතුව පැවතුණි. | අඛණ්ඩව පසු විපරම් කර කඩිනමින් ණය අය කරගත යුතුය. |
| (ආ) | කාබනික පොහොර ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කළ "සාරලංකා" වැඩසටහන යටතේ 2016, 2017, 2018 වර්ෂවල දිස්ත්‍රික් කාර්යාල 21 ක ගොවීන් 318 ක් වෙනුවෙන් රු.69,850,000 ක ණය මුදලක් ගොවීන්ගේ භාරකාර අරමුදලින් ලැබී ඔවුන්ට | "සාරලංකා" වැඩසටහන යටතේ ගොවින්ගේ භාරකාර අරමුදල විසින් 2016, 2017 හා 2018 වර්ෂවලදි ගොවීන් වෙත ලබාදුන් මුදලින් 2024.05.20 දිනට රු.55,898,365 ක් අයවී ඇති අතර තවදුරටත් රු. 13,951,635 ක් අයවීමට | අඛණ්ඩව පසු විපරම් කර කඩිනමින් ණය අය කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නිකුත් කර තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තවදුරටත් අයවිය යුතු මුදල රු. 15,066,874 ක් විය. මෙම ණය මුදල් අයවීම ඉතා දුර්වල මට්ටමක පැවතුණි. | ඇත. | |
| (ඈ) | 2000/2007 කාලය තුළදී වී මිල දී ගැනීමට මහා භාණ්ඩාගාරය විසින් දෙපාර්තමේන්තුවට සෘජුවම අත්තිකාරම් ලබාදී ඇතත් එම මුදලින් තවදුරටත් බදුල්ල සහ අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාල වලින් අයකර පියවිය යුතු මුදල රු. 58,958,665 ක් වූ අතර ඒවා අයකර ගැනීමට 2023 දෙසැම්බර් 31 දින දක්වා කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | අඛණ්ඩව පසු විපරම් කර කඩිනමින් ණය අය කරගත යුතුය. |
| (ඇ) | ලංකා රාජ්‍ය ජාල ව්‍යාපෘතිය මගින් දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණු රැහැන් රහිත අන්තර් ජාල පද්ධතියට අයත් රු.978,013ක් වටිනා checkpoint 3200 වර්ගයේ firewall උපකරණය 2020 වර්ෂයේ මාර්තු 15 දින අස්ථානගතවීම සම්බන්ධයෙන් 2022 අප්‍රියෙල් මස 22 දින ලබා දුන් මූලික විමර්ශන වාර්තාව අනුව එම අලාභය ජල කළමනාකරණ අංශයේ ප්‍රධාන ඉංජිනේරුවරයාගෙන් අයකර ගැනීමට තිරණය කර තිබුණ ද මූලික විමර්ශනය සිදුකරමින් තිබියදී විශ්‍රාම වැටුප් සංග්‍රහයේ 2/17 මගින් 2020 නොවැම්බර් 10 දින විශ්‍රාම ගන්වා තිබුණි. එමෙන්ම ඔහුට උසස්වීමට අදාල හිඟ වැටුප් හා විශ්‍රාම නිලධාරීන් නැවත සේවයේ යෙදවීමේදී ගෙවිය යුතු දීමනාව වශයෙන් රු.1,469,725ක් 2022 දෙසැම්බර් මස ගෙවීම් කිරීමේදී ඉහත අලාභය අයකර නොගැනීම හා අදාළ නිලධාරියා ප්‍රශ්නකාරී අවස්ථාවක විශ්‍රාම වැටුප් සංග්‍රහයේ 2/17 මගින් විශ්‍රාම ගැන්වීම විගණනයට ගැටළු සහගත විය. | පිළිතුරු ලැබී නොමැත. | අලාභයට වගකිව යුතු විශ්‍රාම නිලධාරීයා ගෙන් අයකර ගැනීමට නිති මගින් කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2021 යල කන්නය තුළදී පුරන් කුඹුරු අස්වැද්දීම සඳහා සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් රු.8,251,750 ක මුදලක් මහනුවර ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය වෙත ලබාදී තිබුණු අතර එම මුදල ගොවිජන සේවා කාරක සභා 11 ක් සඳහා පුරන් කුඹුරු පොලී රහිත ණය ලෙස ලබාදී තිබුණි. එකී ණය ලබාදී මාස 06 ක් තුළ නැවත අයකර ගත යුතු වුවද 2023 දෙසැම්බර් 31 දින වන විට තවදුරටත් අයවිය යුතු මුදල රු. 2,459,301 ක් විය. | පිළිතුරු ලැබී නොමැත. | අඛණ්ඩව පසු විපරම් කර කඩිනමින් ණය අය කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | 2023 මැයි 12 දිනැති අංක 02/2021(VIII) හි 02 ඡේදය හා 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන අනුව රාජ්‍ය සේවකයින් සේවා ස්ථානයට පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාර්ක සභා 45 ක එකක් රු. 54,000 බැගින් එකතුව රු.2,430,000 ක් ගෙවා ඇඟිලි සළකුණු යන්ත්‍ර 45 ක් මිලදීගෙන තිබුණද කාර සභා විසින් ඇඟිලි සළකුණු දත්ත පිටපත් ලබාගෙන පැමිණීම හා පිටවීම පරීක්ෂා කර නොතිබු අතර දිස්ත්‍රික් කාර්යාල අධීක්ෂණයක්ද කර නොතිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | අඛණ්ඩව අධීක්ෂණය කර ඇඟිලි සළකුණු දත්ත පිටපත් පරීක්ෂා කළ යුතුය. |
| (උ) | 2022 අගෝස්තු 10 දින දේශීය දෙමුහුම් බඩඉරිඟු බීජ නිෂ්පාදන වැඩසටහන සඳහා ගොවීන්ගේ භාරකාර අරමුදල රු. 9,375,000 ක මුදලක් සියයට 2 ක පොලියද සමඟ රු. 9,562,500 ක මුදලක් 2023 ජනවාරි 11 දිනට පෙර ගෙවිය යුතු වුවත් රු.3,487,500 ක මුදලක් 2023 දෙසැම්බර් 31 දින වන විටත් ගෙවා නොතිබුණි.එම මුදලින් ගොවීන් 15 දෙනෙකු සඳහා රු. 2,700,000 ක ණය මුදලක් ඔක්කම්පිටිය ගොවිජන බැංකුව විසින් ලබාදී තිබුණු අතර එම මුදල මාස 06 කින් අයකර ගත යුතු වුවත් 2023 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු මුදලක් ගොවීන්ගෙන් අය කරගෙන නොතිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | අඛණ්ඩව පසු විපරම් කර කඩිනමින් ණය අය කරගත යුතුය. |
| (ඌ) | 2022/2023 මහ කන්නයේ ජාතික බීජ අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා හදිසි බීජ වී මිලට ගැනීම සඳහා ගොවීන්ගේ භාර අරමුදලින් 2022 අගෝස්තු මාසයේදී රු.50,000,000 ක මුදලක් සහ 2020 වර්ෂයේදී 2020/2021 වර්ෂයේ විශේෂ බඩඉරිඟු ව්‍යාපෘතිය සඳහා ලැබී තිබුණු රු.136,090,000 ක මුදලින් පිළිවෙළින් රු.25,400,000 ක සහ රු.63,910,000 ක මුදලක් ඵලදායී ලෙස භාවිතා නොකර නැවත ගොවීන්ගේ භාරකාර අරමුදල වෙත ගෙවා තිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | ගොවීන්ගේ භාරකාර අරමුදලින් ලද මුදල් ඵලදායී ලෙස භාවිතා කළ යුතුය. |
| (එ) | 2023 දෙසැම්බර් 31 දිනට මු.රෙ. 104 පරීක්ෂණ, 77 ක් මූලික විමර්ශන 431ක් සහ විධිමත් විනය පරීක්ෂණ 103 ක් නොවිසඳී පැවති අතර මෙම විනය පරීක්ෂණ ලිපිගොනුවලින් 293 ක් වර්ෂ 05 ඉක්මවා තිබුණි. ඒ අතර මාස 03 ක් ඇතුළත විසඳිය යුතු මු.රෙ. 104(4) පරීක්ෂණ ලිපිගොනු 37 ක් | පිළිතුරු ලැබී නොමැත. | විනය පරීක්ෂණ කඩිනමින් අවසන් කර රජයට අයවිය යුතුව මුදල් අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පැවති අතර මුළු විනය පරීක්ෂ වලින් රු.66,194,999 ක් රජයට අයවිය යුතුව පැවතුණි. | | |
| (ඒ) | 2014 වර්ෂයේ කුඹුරු ඉඩම් ප්‍රතිශෝධන වැඩසටහන මගින් වී වගා කළ හැකි කුඹුරක් ලෙස කුඹුරු ඉඩම් ලේඛනයේ ලේඛනගත වී ඇති දැලිවල ගොවිජන සේවා බල ප්‍රදේශයේ කුඩාගම දකුණ වසමේ නන්සාරේ ගොඩ කුඹුරු යායේ පිහිටි නන්සාර කුඹුර ගොවිජන සංවර්ධන කොමසාරිස්ගේ ලිඛිත අවසරයක් නොමැතිව 2019 වර්ෂයේ සිට යායේ අනෙක් කුඹුරුවලට ජලය හා කෘෂි උපකරණ ලබාගැනීමට බාධාවන පරිදි අතිරේක ආහාර බෝග වගා කිරීම සම්බන්ධ එම කුඹුර ඉඩම් හිමියාට නීතිමය පියවර ගෙන යායේ අනෙක් වගාකරුවන්ට වගා කටයුතුවලට තිබුණු බාධක ඉවත් කිරීමට ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | ගොවි ගැටළු කඩිනමින් විසඳීමට කටයුතු කළ යුතුය. |
| (ඔ) | 2022 ඔක්තෝබර් 23 දින 2022/23 මහ කන්නය සඳහා ගොවීන්ට ලබාදීමට මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන 23 ක් වෙත පෞද්ගලික ආයතන මගින් පරිසර හිතකාමී පොහොර බෙදා හැරීමේදී දිස්ත්‍රික් කාර්යාලය මගින් නිසි අභ්‍යන්තර පාලන ක්‍රමවේදයෙන් බැහැරව යමින් බැදියාවන් අතර ගැටුමක් ඇති වන ආකාරයෙන් කටයුතු කර පරිසර හිතකාමී පොහොර සැපයුම්කරුවන් මගින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව ලෙස රාජ්‍ය ආයතනයක නම සහිත පොහොර භාර ගැනීමේ කුවිතාන්සි (GRN) මුද්‍රණය කරවා කිසිඳු ලේඛනගත කිරීමකින් තොරව එම සමාගම්වල නියෝජිතයින් ලවාම ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත බෙදා හැරීමට කටයුතු කර තිබුණි. ඒ අනුව එක් එක් ගොවිජන සේවා මධ්‍යස්ථානය භාවිතා කළේ කුමන අනුක්‍රමික අංක සහිත පොහොර භාරගැනීමේ කුවිතාන්සි පොත්ද යන්න පිළිබඳව අවබෝධය හෝ ඒ සම්බන්ධ ලේඛන තබා ගැනීමක් ගෙවීම් නිර්දේශ කිරීමේ නිලධාරියා සතුව නොතිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | අවිධිමත් ගනුදෙනු සිදු නොවීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතුය. |
| (ඕ) | 2004 වර්ෂයේ සිට මේ දක්වා මහරගම අංක 527/A කෘෂිකර්ම පර්යේෂණ හා නිශ්පාදන සහකාර නිලධාරි කොට්ඨාශයේ කෘෂිකාර්මික ඉඩම් නාම ලේඛනයේ අනුක්‍රමික අංක 44 යටතේ වූ ඉඩමේ වර්ථමානයේදී අනවසරයෙන් ස්ථිර නිවාස 6ක් ඉදිකර තිබුණු අතර අනුක්‍රමික | පිළිතුරු ලැබී නොමැත. | අනවසර ඉදි කිරීම් ගැටළු කඩිනමින් විසඳීමට කටයුතු කළ යුතුය. |

අංක 42 හි ඉඩම ගොඩ කර ස්ථිර භෝග වගා කර ස්ථිර ගොඩනැගිල්ලක්ද ඉදි කරමින් පැවතුනි. පනතේ 32.1 සහ 33.1 වගන්ති වල සඳහන් පරිදි ඉඩම් හිමියා සහ අඳ ගොවියා විසින් ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයා මේ සම්බන්ධයෙන් දැනුවත් නොකිරීම නිසා ඔවුන්ද පනත අනුව වරදකරුවන් වන්නේය. 2004 වර්ෂයේ සිට මේ දක්වා සේවය කළ ගොවිජන සංවර්ධන නිලධාරීන්, කෘෂිකර්ම පර්යේෂණ හා නිශ්පාදන සහකාර නිලධාරින් සහ වෙනත් වගකිව යුතු නිලධාරීන් අනවසර ගොඩ කිරීම් හා ඉදිකිරීම් සම්බන්ධයෙන් නිසිපරිදි ක්‍රියා මාර්ග නොගැනීම නිසා අවට නිවාස සහ ප්‍රදේශවාසීන් ජලයෙන් යටවීම සහ ගං වතුර තර්ජන වලට එල්ලවීම නිසා ඔවුන් විසින් ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත දැනුවත් කර තිබුණද අනවසර ඉදි කිරීම් හා ස්ථිර බෝග වගා කිරීම් සම්බන්ධයෙන් මේ දක්වා නිසි ක්‍රියා මාර්ග ගෙන නොතිබුණු අතර 30.1 වගන්තිය අනුව කුඹුරු ඉඩම් වල වී වගා කිරීමට කටයුතු කරන ලෙස දන්වා තිබුණි.

## 4. මානව සම්පත් කළමනාකරණය

### 4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව 19,764 ක් වූ අතර මුළු පුරප්පාඩු සංඛ්‍යාව 5,723 ක් විය. | 2024.04.30 දින වන විට මෙම දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව 19,764 ක් වූ අතර තනතුරු 48 සඳහා තථ්‍ය කාර්ය මණ්ඩලය 13,930 වන අතර, මුළු පුරප්පාඩු සංඛ්‍යාව 5,834ක් වේ. 2023 වර්ෂයේ දෙපාර්තමේන්තුව විසින් තනතුරු 08 සඳහා නිලධාරීන් 369 බඳවා ගන්නා ලදී. අත්‍යවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවාගැනීම් පිළිබඳ සඳහන් කර සකස්කරන ලද වාර්තාවක් අග්‍රාමාත්‍ය කාර්යාලය හා කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යැවීමට කටයුතු සිදුකරමින් පවතී. | නිසි ඇගයීමක් සිදු කර අත්‍යවශ්‍ය පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන (අති විශේෂ) ගැසට් පත්‍රයේ පළ කර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය පටිපාටික රීති (කාණ්ඩ අංක 01) හි XVIII පරිච්ඡේදයේ රාජ්‍ය නිලධාරීන්ගේ | පිළිතුරු ලැබී නොමැත. | චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාන මාරුවීම් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ස්ථාන මාරුවීම් සම්බන්ධව විධිවිධාන මගින් හා 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් අවුරුදු 05 ක් එකම තනතුරේ/සේවා ස්ථානයේ සේවය කරන ඇති සෑම නිලධාරියෙක්ම ස්ථාන මාරු කළ යුතු බව දක්වා තිබුණද මහනුවර ගොවිජන සේවා දිස්ත්‍රික් කාර්යාලයේ නිලධාරීන් 28 දෙනෙකු අවුරුදු 05 ත් 18 ත් අතර කාලයක් එකම ස්ථානයේ සේවයේ යොදවා ගෙන තිබුණි. | | |
| (ඇ) | 2012 ජුනි 20 දිනැති DMS/G2/56/01 අංක දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව ලිපිය අනුව චීන රජයෙන් ලබාදුන් යන්ත්‍රෝපකරණ සඳහා වැඩසටහන් නිලධාරීන් 05 ක්,(යාන්ත්‍රික) හා කාර්මික (යාන්ත්‍රික) 08 ක් බඳවා ගැනීමට අවසර ලබාදී තිබියදීත් 2024 මාර්තු 31 දින දක්වා එම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි. එසේ වුවද විශ්‍රාමික නිලධාරියකුගේ සේවය නැවත ලබාගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් ඉල්ලීම් කිරීමේදී වර්ෂ 10 ක් තුළ බඳවා ගැනීමට කටයුතු නොකළ කාර්මික සහ යාන්ත්‍රික නිලධාරීන් පුහුණු කිරීම සඳහා යාන්ත්‍රික අධිකාරීවරයා නැවත සේවයේ පිහිටුවීමට අවශය බව සඳහන් කර අවසර ඉල්ලා තිබුණි. | කාර්මික නිලධාරී (යාන්ත්‍රික) අනුමත තනතුරු 05ම පුරප්පාඩු වී පැවති අතර 2021.12.04 දින පැවති පුරප්පාඩු පිරවීමට අදාල විවෘත ලිඛිත තරඟ විභාගයේ ප්‍රතිඵල අනුව එක් අයදුම්කරුවෙක් පමණක් සමත්වී ඇත. ඒ අනුව එම අයදුම්කරු සම්මුඛ පරීක්ෂණයද සමත් වූ නමුත් තනතුර භාරගෙන නොමැති බැවින් කාර්මික නිලධාරී (යාන්ත්‍රික) අනුමත තනතුරු 05ම මේ වන විටත් පුරප්පාඩුව පවතී.එබැවින් මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතුව සිට විශ්‍රාම ගන්වන ලද යාන්ත්‍රික අධිකාරි පී.ඒ ආනන්ද වීරවංශ මයා 2024.02.12 දින සිට 2025.02.08 තෙක් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යොදවා ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් ඉල්ලීමක් කළ අතර ඒ සඳහා අනුමැතිය ලැබී ඇත. | විශ්‍රාමිකයින් නැවත සේවයේ යෙදවීම විසඳුමක් ලෙස නොගෙන ස්ථිර පදනමින් නිලධාරීන් බඳවා ගත යුතුය. |
| (ඇ) | හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලයේ ක්‍රියාකාරී තත්ත්වයේ පවතින යන්ත්‍ර 06 ක් සඳහා යන්ත්‍ර ක්‍රියාකරුවන් 06 ක් යොදවා ඇතත්,එම යන්ත්‍ර 04 ක් 2023 වර්ෂය තුළදී කිසිඳු කාර්යයකට නොයොදවා තිබුණි. එම යන්ත්‍ර ක්‍රියාකරුවන් සඳහා වෙනත් කාර්යයක් හෝ නොපවරා තිබු අතර ඔවුන් දෛනිකව දිස්ත්‍රික් කාර්යාලයටද වාර්තා කර නොතිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | යන්ත්‍ර උපයෝජනයට නව සැලස්මක් සකස් කර පූර්ණ ලෙස උපයෝජනය කළ යුතු අතර නිශ්කාර්ය ශ්‍රමය ඵලදායීව යොදා ගත යුතුය. |